# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

**මූල්‍ය කළමනාකරණ අංශය**
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No | NWP/CS/F/32/01/IN.AU.GU | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.04.17 |

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,
ලේකම්,වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සභා ලේකම්,වයඹ පළාත් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් සහ
සියළුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත.

DCS (Admn) 19 APR 2023 AD/02 9/4/19 286950

**<u>පළාත් මූල්‍ය රීති 562 අනුව රජයේ චක්‍රලේඛ / මාර්ගෝපදේශ පළාත් සභාවට අදාළ කිරීම.</u>**

කළමනාකරණ විගණන අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023.01.23 දිනැතිව නිකුත් කර ඇති කළමනාකරණ විගණන මාර්ගෝපදේශ අංක DMA/01- 2023 (පිටපතක් අමුණා එවමි) සංශෝධනයකින් තොරව වයඹ පළාත් සභාවට අදාළ කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2023.03.30 දින ලැබී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක NWP/GOV/AD11/1/1/17/2 සහ 2023.03.31 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත. ඒ අනුව එම මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

| අනු අංකය | මාර්ගෝපදේශයේ අංකය හා දිනය | විස්තරය |
|---|---|---|
| 1 | කළමනාකරණ විගණන මාර්ගෝපදේශ<br>අංක - DMA/01-2023<br>දිනය - 2023.01.23 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම. |

ජී.ජී.සී.ප්‍රේමකුමාර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය කළමනාකරණ)

අ/කළේ: රංජිත් ආරියරත්න
ප්‍රධාන ලේකම් (වයඹ)

පිටපත: 1. සහකාර ප්‍රධාන ලේකම්, ආයතන - උක්ත විගණන මාර්ගෝපදේශය, ප්‍රධාන ලේකම් වෙබ් අඩවියේ (www.cs.nw.gov.lk) පල කිරීම සඳහා

අධ්‍යක්ෂ (මුදල් හා ආදායම්) / இயக்குனர் (நிதி மற்றும் வருவாய்) / Director (Finance & Revenue) — Tel : 037-2223332, Fax : 037-2223332, e-mail: dirafinrevnwpc@gmail.com

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதான செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதான செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel : 037-2228128, Fax : 037-2223731, e-mail : dcsfnnwpc@gmail.com, dcsfinance@nw.gov.lk

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01
செயலகம், கொழும்பு 01
The Secretariat, Colombo 01


16 FEB 2023

මගේ අංකය / எனது இல / My No } DMA/AMC/M/2023/02

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2023.01.23

15 FEB 2023

කළමනාකරණ විගණන මාර්ගෝපදේශ :- DMA/01-2023

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම</u>**

අප දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019.01.12 දිනැති අංක DMA/01-2019 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය, 2019.05.21 දිනැති DMA/01/2019/Letter දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛ ලිපිය සහ 2020.08.26 දිනැති පළාත් අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අංක 01 මගින් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම සහ එම රැස්වීම් පැවැත්වීම සම්බන්ධ විධිවිධාන සහ ඒ සඳහා භාවිතා කළ යුතු ආදර්ශ ආකෘති හඳුන්වා දී ඇත.

02. පසුගිය කාලය තුල සියලු රජයේ ආයතන වල පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම විගණකාධිපති විගණන විමසුම්, අභ්‍යන්තර විගණන වාර්තා සහ වෙනත් කළමනාකරණමය කරුණු [illegible] සාකච්ඡාවට බඳුන් කරනු ලැබූ බොහෝ කරුණු සඳහා ඉතා සාර්ථක විසඳුම් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ඇතැම් කරුණු විසඳුමකින් තොරව නැවත නැවත සාකච්ඡා කරනු ලබන බවද වාර්තා වී ඇත. එවැනි කරුණු රැස්වීම් වාර 20 කටත් වඩා වැඩි වාර ගණනක් තුල සාකච්ඡා කල අවස්ථා ද දක්නට ලැබේ. මෙම තත්ත්වය නිසා වර්තමානයේ විගණන වාර්තා මගින් පෙන්වා දෙනු ලබන ඉතා වැදගත් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට යොදවන කාලය අවම වී ඇති බවද නිරීක්ෂණය වේ. මෙවැනි සමහර වැදගත් කරුණු කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමකදී සාකච්ඡාවට භාජනය නොවීම නිසා රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ ප්‍රශ්න කිරීම් වලට ද ලක් වන බව නිරීක්ෂණය වේ.

03. ඉහත තත්ත්වය වලක්වා ගැනීමට සෑම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමකදීම, ඊට පෙර කාර්තුව දක්වා ඉදිරිපත් වූ විගණකාධිපති විගණන විමසුම්, අභ්‍යන්තර විගණන වාර්තා හා වෙනත් කළමනාකරණමය කරුණු මගින් පෙන්වා දී ඇති, ආයතනයේ කාර්යසාධනයට හා මූල්‍ය විනය යහපත්ව පවත්වාගෙන යාමට වඩාත් වැදගත් වන කරුණු කල් ගත වීමට පෙර සාකච්ඡා කර ඒවා සඳහා කඩිනම් විසඳුම් ලබා ගැනීමෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වඩාත් ඵලදායී තත්වයට පත් කර ගත හැකිය.

04. ඒ අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ ඵලදායීතාව වඩාත් ඉහල නංවා ගැනීම සඳහා පහත පියවරයන් අනුගමනය කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.


කාර්යාලය / அலுவலகம் / Office } 2484816 2484500 2484600 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General } 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax } 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website } www.treasury.gov.lk